## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ

## ආශ්‍රිත නිලධාරී සේවා ගණය

## සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන:

| | | | |
|---|---|---|---|
| 1.1 කොමිෂන් සභාව: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | යොමු අංකය: | BC/E/01/04/34 | දිනය:2017.11.27 |
| 1.2අමාත්‍යාංශය : | අදාළ නොවේ. | | |
| 1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය: | DMS/1012<br>DMS/1012 Vol I | දිනය:2015.04.21<br>2016.08.01<br>2017.06.02<br>2017.09.25 |
| 1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය: | EST-2/06/REC/ 15614 | දිනය:2017.11.09<br>2017.11.10<br>2017.12.20 |
| 1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය: | NSCC/10/87/SR | දිනය:2017.10.10<br>2017.11.13 |
| 1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය: | PSC/EST/06-01-62/01/2018 | දිනය:2018.02.20 |

**02.** පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කෙමිෂන් සභාව විසින් බලය පවරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරී

3.2 ශ්‍රේණි/ තනතුරු : III,II,I

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනික අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්යභාරයට උපස්ථම්භක වන්නා වූ විමර්ශන, තොරතුරු හා දත්ත රැස් කිරීම/ විශ්ලේෂණය /සම්පාදනය / සමීක්ෂණය වැනි කාර්යයන් නිශ්චිත කාර්යභාරයක් වූද බඳවා ගැනීමේ මූලික සුදුසුකම වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූද කාර්යභාරයක් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04.** **තනතුරෙහි/තනතුරුවල ස්වභාවය** :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 4-2016

5.2 මාසික වැටුප් පරිමාණය: රු.31,490-10X445-11X 660-10X730-5X750-54,250/-

5.3 ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල මාසික වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|
| III | 01 පියවර | 31,490/- |
| II | 12 පියවර | 36,600/- |
| I | 23 පියවර | 43,930/- |

2016.01.01 දින සිට 2020.01.01 දින දක්වා වැටුප් ගෙවීම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II හි සඳහන් පරිදි විය යුතුය.

**06. සේවා ගණයට අයත් තනතුරු/ තනතුරු**

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| නීති සහකාර | III, II හා I | 17 | • නීති වාර්තා කෙටුම්පත් කිරීම.<br>• නීති වාර්තා සකස් කිරීම සඳහා කොමිෂන් සභාවේ නීති නිලධාරීන්ට සහාය වීම. |
| දූෂණ නිවාරණ නිලධාරී | III, II හා I | 50 | • දූෂණ නිවාරණ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින්, පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් සංවිධානය කිරීම හා පවත්වාගෙන යාම.<br>• අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූලික විමර්ශන කටයුතු විධි විධාන පරිදි ඉටු කිරීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| | |
|---|---|
| නීති සහකාර | 17 |
| දූෂණ නිවාරණ නිලධාරී | 50 |

- ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්:

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තිය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7.2.2.5 වෙනත් :

I ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

ii විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය

iii අයදුම්කරු හෝ පවුලේ අයෙකු ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරු වී නොතිබිය යුතුය.

iv අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 7.2.2 සිට 7.2.3 දක්වා සියළුම සුදුසුකම් සෑම අයුරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

v ආරක්ෂක නිෂ්කාශන වාර්තා වලට යටත්ව බඳවා ගනු ලැබේ.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අවු: 21 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව :- අවු 35 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින්

7.2.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

7.2.4.4 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය 100 | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| භාෂා ප්‍රවීනතාවය | 20 | අදාළ නොවේ |
| පරිගණක සාක්ෂරතාවය | 15 | |
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සුදුසුකම් | 20 | |
| පර්යේෂණ නිබන්ධන හා විෂය විශ්ලේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද | 20 | |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |

සංලක්ෂය :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.
2. එම විස්තරාත්මක ලකුණු පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ පළ කරනු ලැබේ.
3. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.
4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

7.2.4.4.1 යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින්

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ.

## 08.කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය /වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. |

(විෂය නිර්දේශය ඇමුණුම II , III හා IVලෙස දක්වා ඇත)

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

| | |
|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම<br>2 වන කාර්යක්ෂමතා කඩඉම<br>3 වන කාර්යක්ෂමතා කඩඉම | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් |

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබාගත යුතු ය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම :

### 10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම:-

සාමාන්‍ය කාර්ය සාධනය අනුව සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක (10) ක් උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක්(10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

### 10.2 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම:-

සාමාන්‍ය කාර්ය සාධනය අනුව සපුරාලිය යුතු සුදුසුකම් :-

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.

ii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ(05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**සංලක්ෂය:**

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

11.තනතුරුවලට පත් කිරීම: අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි:

ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා විධිවිධානවලට සහ දෙපාර්තමේන්තු නීතිරීති , චක්‍රලේඛ, රෙගුලාසි හා නියෝගවලට යටත් වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන : අදාළ නොවේ.

සකස් කළේ : අත්සන ....[signature]....
2018.03.13.

පරීක්ෂා කලේ :

අත්සන ....[signature]....

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ආර්.පී.පී. ලියනගේ

මාණ්ඩලික සහකාර

තනතුර : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

දිනය : 2018.03.14

නිල මුද්‍රාව : 36, මලලසේකර මාවත, කොළඹ 07.

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ....[signature]....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ඒ.එම්.ආර්.එස්.ඒ. අධිකාරී

තනතුර : අධ්‍යක්ෂ (පාලන)

දිනය : 2018.03.14

නිල මුද්‍රාව : අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, 36, මලලසේකර මාවත, කොළඹ 07.

යොමු අංකය : BC/E/1/4/34

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ............................................

නම............................................

ලේකම්

............................ අමාත්‍යාංශය

දිනය: 2018. 03. 14

නිල මුද්‍රාව: ජනාධිපති නීතිඥ, සරත් ජයමාන්න
අධ්‍යක්ෂ ජනරාල්
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව
අංක: 36, මලලසේකර මාවත, කොළඹ 07

---

යොමු අංකය: PST/EST/06-01-62/01/2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය 2018.02.20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ............................

නම : ඒ. කුලතුංග

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය: 2018.03.23

නිල මුද්‍රාව : ඒ. කුලතුංග
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**01.** **විභාගයේ/වෘත්තීය පරීක්ෂණයේ නම:** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** **විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |
| නීතිය | පැය 02 | 100 | 40 |

**03.** **පවත්වනු ලබන බලධරයා:** රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්

**04.** **පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:** වසරකට දෙවරක්

**05.** **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | පරිච්ඡේදය ii - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත් කිරීම<br>පරිච්ඡේදය vii - අතිකාල දීමනා, නිවාඩු දවස් හා නිවාඩු දින වැටුප්<br>පරිච්ඡේදය xii - නිවාඩු<br>පරිච්ඡේදය xiii - දුම්රිය බලපත්‍ර<br>පරිච්ඡේදය xvi - නිවාඩු ගමන්<br>පරිච්ඡේදය xxviii - පරිපාලන කාර්ය පරිපාටිය හා විධි<br>පරිච්ඡේදය xxx - ආණ්ඩුවේ සේවකයින් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>පරිච්ඡේදය xLvii - සාමාන්‍ය හැසිරීම් සහ විනය<br>පරිච්ඡේදය xLviii - විනය ක්‍රියා පරිපාටිය |
| මුදල් රෙගුලාසි | i වියදම් හා ආදායම් ඇස්තමේන්තු<br>ii වියදම් ආපසු ගෙවීම්, කපා හැරීම් ආදිය සඳහා අධිකාර බලය<br>iii මුදල් පාලනය හා ගිණුම් ගත කල හැකිවීම<br>iv ලැබීම් |

| | |
|---|---|
| | v ගෙවීම්<br>vi ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම<br>vii ගණන් තැබීම<br>viii අත්තිකාරම් ගිණුම්<br>ix කච්චේරි ගිණුම්<br>x අධිකරණවල ගිණුම්<br>xi විදේශාධාර<br>xii මුද්‍රණය හා ප්‍රකාශනය<br>xiii සැපයුම්,වැඩ හා සේවා<br>xiv විවිධ කරුණු |
| නීතිය | i 1994 අංක 19 දරණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත<br>ii අල්ලස් පනත |

අත්සන:.............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:.............................................

තනතුර:.............................................

දිනය: 2018 - 3 - 14

නිල මුද්‍රාව: ජේ.එම්.ආර්.එස්.ජේ. අධිකාරි
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

ඇමුණුම II

**01.** විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40 |
| නීතිය | පැය 02 | 100 | 40 |

**03.** පවත්වනු ලබන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින්

**04.** ලිඛිත පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග:

වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ශ්‍රී ලංකා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | සියළු පරිච්ඡේද ආවරණය වන පරිදි |
| මුදල් රෙගුලාසි | සියළු පරිච්ඡේද ආවරණය වන පරිදි |
| නීතිය | 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය |

අත්සන:.............................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:.............................................

තනතුර:.............................................

දිනය: 2018-03-14

නිල මුද්‍රාව: ජී.එම්.ආර්.එස්.ජී. අධිකාරී
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා
කොමිෂන් සභාව
36, මලලසේකර මාවත,
කොළඹ 07.

ඇමුණුම III

01. විභාගයේ/ වෘත්තීය පරීක්ෂණයේ නම: අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණය සඳහා වන තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය/වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය පරිපාලනය | පැය 02 | 100 | 40 |
| නීතිය | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග: වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය පරිපාලනය | • ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි<br>• ආයතන සංග්‍රහය<br>• ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය |
| නීතිය | • ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව<br>• සාක්ෂි ආඥා පනත<br>• 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත<br>• 2015 අංක 04 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත<br>• රිට් ආඥා<br>• 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත<br>• 2002 අංක 25 දරණ සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාවය ලබා ගැනීමේ පනත<br>• වත්කම් අත්පත් කර ගැනීමට අදාල නීති |

අත්සන:.......................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම:.......................................

තනතුර:.......................................

දිනය:....2018 - 03 - 14..........

නිල මුද්‍රාව: ඒ.එම්.ආර්.එස්.ඒ. අධිකාරී
අධ්‍යක්ෂ (පාලන)
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව